# 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් වර්ධනය වූ පුරවැසි නිදහස

**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රකාශනයක්**

## 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් වර්ධනය වූ පුරවැසි නිදහස

- අපේ ජීවිතවල ආර්ථික, සමාජ, දේශපාලන ආදී බොහෝ කටයුතු පාලනය කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවය. එම පාලනය අප පත්කර ගන්නා පාලකයන් අනුව යහ පාලනයක් හෝ වහ පාලනයක් විය හැකිය.

- 1978 ආ.ක්‍ර. ව්‍යවස්ථාවේ සිට 2015 දක්වා ඊට සංශෝධන 18ක් ඇතිවිය. ඒ 18 එන විට අපේ කලකිරීම වැඩි වූයේ, එදා සිට පත් වූ ජනාධිපතිවරුන් පස්දෙනාගෙන් හතර දෙනකුම ජනාධිපති බලය අනිසි ලෙස භාවිත කිරීමෙන් පුරවැසි නිදහස සීමාවීම නිසා ය.

- 19 වැනි සංශෝධනයෙන් සිදුවූයේ 1978 සිට එකතුකරගත් ජනාධිපති බලතල අත්හැරීමය. එසේ තිබෙන බලයක් අත් හැරීමක් ලෝකයේ සිදුවන්නේ ඉතා කලාතුරකිනි.

- එසේ බලය අත් හැරීම නිසා පුරවැසියාගේ නිදහස පුළුල් වන්නේ ය. එසේ පුළුල් වූ හැටි විමසා බලමු.

## ජනාධිපති බලතල සහ එහි අනිටු ප්‍රතිඵල

- 1978 ආ.ක්‍ර. ව්‍යවස්ථාවෙන් ඒකාධිපති බලතල ජනාධිපතිට පැවරිණ. එය පළමුවෙන් යෙදුණේ හිතුවක්කාර ලෙස 1980 මහ වැඩ වර්ජනයත් වෘත්තීය සමිතිත් මර්දනය කිරීමටය.

- 1983 වාර්ගික ගැටුම් සහ යුද්ධය පටන් ගැනීමට එම විධායක බලය යෙදිණ.

- 13 ව්‍යවස්ථා සංශෝධනයෙන් උතුරේ පළාත් සභා බලතල දීමට ගිවිසුමක් ඉන්දියාව සමග ඇතිවිය. එහෙත් ජනාධිපති බලතල යොදා එම ගිවිසුම ක්‍රියාත්මක නොකළේ ය.

- 19 වැනි සංශෝධනය යටතේ ඉහත සඳහන් සිදුවීම් ඒ අන්දමින් සිදුවිය නොහැකිය. මක් නිසාද, තනි මතයට තීන්දු නොගෙන පාර්ලිමේන්තුවේ මැදිහත්වීමෙන් තීන්දු ගතයුතු නිසාය.

- 2000 දී, තිබුණ ව්‍යවස්ථාවට වඩා හොඳ ව්‍යවස්ථාවක් ඉදිරිපත් විය. නොපැසුණු දේශපාලනය නිසා එය පරාජයට පත්විය. ඒ සමග ජනාධිපතිනිය අතිසි ලෙස බලයෙන් වැඩුණා ය.

- ජනාධිපති බලතල සීමාවිය යුතුය යි පුළුල් ජනමතයක් ඇතිවීමේ ප්‍රතිඵලයක් ලෙස 17 වැනි සංශෝධනය සම්මත විය. එම සංශෝධනයේ අඩුපාඩුකම් නිසා ජනාධිපති බලතල වලින් ව්‍යවස්ථාව පවා යටකර ගැනිණි.

- මැතිවරණ කොමිසම නොපහිටුවීම 17 සංශෝධනයේ පළමු උල්ලංඝනය විය.

- හිටපු ජනාධිපතිනියගේ ධුර කාල දෙක අවසන් වූයෙන් අලුත් ජනාධිපතිවරයෙක් පත්විය.

## අලුත් ජනාධිපති 17 සංශෝධනය උල්ලංඝනය කරයි

- ව්‍යවස්ථා සභාව පත් නොකිරීමෙන් කොමිෂන් සභා ද ඇති නොවීය.
- ජනාධිපතිවරයා තමන් කැමති අය කොමිෂන් සභාවලට පත් කළේ ය. එමගින් 17 සහ 13 යන සංශෝධන දෙකම උල්ලංඝනය කළේ ය.
- මහජනයා ඡන්දයෙන් පවරා දෙන බලය මහජන යහපත උදෙසා භාවිත විය යුතුය. පාර්ලිමේන්තුවේ දී එම යහපාලනය ක්‍රියාත්මක වන්නේ කාරක සභා මාර්ගයෙනි.
- එයින් දෙකක් වූ පොදු ව්‍යවසාය කාරක සභාව (COPE) සහ පොදු ගිණුම් කාරක සභාව (COPA) ඉතා වැදගත් ය. රාජ්‍ය ආයතන වල දූෂණය, නාස්තිය, වංචාව ආදිය සිදුවී ඇද්දැයි එයින් සොයා බැලේ. දූෂණය, නාස්තිය සිදුවී ඇති බව සොයා ගැනුණත් ඒවා වසා දැමිණ. පසුව එම කාරක සභාවලටත් තමන් කැමති පත්වීම් දීමෙන් කාරක සභා බෙලහීන කර දැමිණ.

19 වැනි සංශෝධනයෙන් පසු මේ කාරක සභා නිසි ලෙස පත්වීමට මග පෑදී ඇත. එයින් සොයා ගන්නා කරුණු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු නිසා දූෂණ වසංකළ නොහැකිය. ඒ නිසා කෝටි ගණන් පුරවැසියන්ගේ මුදල් ඔවුන්ගේ යහපතට ම යෙදිය හැකිවනු ඇත.

## විධායක ජනාධිපති ධුරය

- ජනාධිපතිවරුන් විධායක බලය භාවිත කිරීම නිසා ඔවුන්ට බොහෝ දේ ලැබුණා නිසැකය. එහෙත් ජනතාවට තිබුණු ප්‍රජාතන්ත්‍රවාදයත් නැතිවීමෙන් බොහෝ දේ නැතිවිය.

- එහෙයින් විධායක ජනාධිපති ධුරය නැති කළ යුතු බවට කලක් තිස්සේ ජනමතය ගොඩනැගීම වැළැක්වීමට 18 වැනි සංශෝධනය බලහත්කාරයෙන් ම ඇතිකර ගැනිණ. දේශපාලන බලයෙන් අධිකරණය ද යටකර ගැනිණ. තමන්ට වුවමනා අධිකරණ තීන්දු බලපෑමෙන් ලබා ගෙන සාධාරණ තීන්දුවක් බව මතුපිටින් පෙන්වනු ලැබිණ.

- 17 වැනි සංශෝධනයෙන් ජනාධිපති විධායක බලය සීමා කිරීමට ස්වාධීන කොමිෂන් සභා 9ක් සඳහන් කර තිබිණ. එම කොමිෂන් සභා සාමාජිකයන් පත් කිරීමට ව්‍යවස්ථා සභාවක් යෝජනා විය.

- ව්‍යවස්ථා සභාවට දස දෙනෙකි. පස් දෙනකු දේශපාලකයන් ය. පස් දෙනෙක් දේශපාලන පක්ෂ වලට අයත් නැති විද්වතුන් පස් දෙනෙකි. මේ ව්‍යවස්ථා සභාවේ නිර්දේශය නැතිව කොමිසම් වලට කිසිම සාමාජිකයකු පත් කළ නොහැකි විය.

- එහෙත් ව්‍යවස්ථා සභාව නිසිලෙස පත් නොකොට සියලු පත්වීම් ජනාධිපතිගේ අතට ගති. සියලු පත්වීම් තනි කැමැත්තට සිදුවිය.

## අපකීර්තිමත් 18 වැනි සංශෝධනය

- ආණ්ඩුවේ අස්සක් මුල්ලක් නෑර සියලු බලතල, තීරණ ගැනීමට බලපෑම ජනාධිපතිට ම පැවරෙන පනතකි. පාර්ලිමේන්තුවේ තීරණ ගැනීමේ බලයත් ජනාධිපතිම පවරා ගති. ඒ අනුව ස්වාධීන කොමිෂන් සභා නැතිවී ඒ වෙනුවට රූකඩ සභා ඇතිවිය. අධිකරණය, පොලිසිය පවා ජනාධිපතිගේ වුවමනාව අනුව ක්‍රියා කළේය.

- ජනාධිපතිවරයා, කලින් අග්‍රාණ්ඩුකාරයාගේ ද, අගමැතිගෙ ද බලතල භාවිත කරයි. කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා ය. අගවිනිසුරු, නීතිපති, පොලිස් පති, හමුදා පතිවරු ආදී සියලු ප්‍රධානයන් පත් කරන්නේ ජනාධිපතිය. ඒ සමග ආරක්ෂක ඇමතිධුරයත්, මුදල් ඇමති ධුරයත් පවරා ගනී. ආයෝජන මණ්ඩලය, දක්ෂිණ ලංකා අධිකාරිය, අධිවේගී මාර්ග, වරාය, විදුලි බලාගාර ආදීය නීතියක් නැතිවම තමන් වෙත පවරා ගැනිණ.

## මේ තත්වයෙන් රට ගොඩ ගැනීමේ දැඩි අවශ්‍යතාවක් පැන නැගිණ. 19 වැනි සංශෝධනය යනු එම අවශ්‍යතාවයි.

- 18 සංශෝධනයෙන් සියලු බලය පවරා ගැනීමෙන් ප්‍රකාශවූයේ "රාජ්‍යය නම් මමය" යන අදහසය. 19 වැනි සංශෝධනයෙන් අදහස් වූයේ "රාජ්‍යය නම් ජනතාවය" යනුයි. එහෙත් එය සම්පූර්ණයෙන් ඉටු නොවීය.

- කලින් තිබුණේ, ජනාධිපති ධුරය දැරිය හැක්කේ වාර දෙකක් පමණක් බවය. 18 න් ඒ සීමාව ඉවත් කිරීමෙන් කැමතිතාක් කල් ජනාධිපති ලෙස පත්විය හැකි බවට වෙනස් කැරිණ. 19න් කළේ එය යළිත් වාර දෙකක් බවට පත් කිරීමය.

- කලින් එක් වාරයක් යනු අවුරුදු 6කි. 19න් එය තවත් සීමා කොට අවුරුදු 5ක් බවට පැනැවිණ. ඒ අතර එම ධූරයට තරග කිරීමේ වයස 30 වෙනස් වී 35ක් විය.

- කලින් ජනාධිපති දෙපළක් විසින්ම නිසි පරිදි ක්‍රියාත්මක නොකළ ව්‍යවස්ථා සභාව පත් කිරීම වැදගත්ම පියවරකි. ආණ්ඩුවේ ඉහළ තනතුරු වලට ස්වාධීන සහ කොමිෂන් සභා සාමාජිකයන් නිර්දේශ කරන්නේ ව්‍යවස්ථා සභාවය. එමගින් ජනාධිපතිගේ හිතුමතේ ට පත් කිරීම අවසන් විය.

එහෙත් මේ ව්‍යවස්ථා සභාවට සිවිල් සමාජයෙන් විද්වතුන් පස් දෙනකු පත් කළයුතුය යන යෝජනාව ශ්‍රීලනිප යේ බලපෑම නිසා තුන්දෙනෙකු දක්වා අඩුකර ඇත. කෙසේ වුවද කලින් ජනාධිපති තනි මතයට කළ පත්වීම් දැන් ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත සිදුවේ. මෙය ඉතා වැදගත් ප්‍රජාතන්ත්‍රවාදී පියවරකි.

කලින් පැවතියේ කොමිෂන් සභා හතකි. දැන් එය නවයක් දක්වා වැඩි වී ඇත. එම කොමිෂන් සභා මෙසේ ය.

- **මැතිවරණ කොමිසම**
- **රාජ්‍ය සේවා කොමිසම**
- **ජාතික පොලිස් කොමිසම**
- **මානව හිමිකම් කොමිසම**
- **අල්ලස හා දූෂණ විමර්ශන කොමිසම**
- **මූල්‍ය කොමිසම**
- **සීමා නිර්ණය කොමිසම**
- **ගිණුම් සේවා කොමිසම**
- **ජාතික ප්‍රසම්පාදන (ටෙන්ඩර්) කොමිසම**

ඉහත සඳහන් කොමිෂන් සභා දැන් ස්වාධීන ය. කලින් තිබුණේ ජනාධිපති යටතේ ය.

එසේ දැන් නැති, කලින් සිදු වූ අකටයුතුකම් ස්වල්පයක් මෙසේ ය.

- කලින් නීතිපතිවරයා පත් කළේ කෙළින්ම ජනාධිපති ය. එහෙයින් සමහර මිනීමැරුම් චෝදනා තිබූ අයට පවා තිබුණු නඩු ඉල්ලා අස්කර ගැනිණ.
- කලින් පොලිස්පති කෙලින් ම පත් කළේ ජනාධිපතිය. ඒ නිසා මිනීමැරුම්, දූෂණ හා අපරාධ කළ සමහර පක්ෂ හිතවතුන් අත් අඩංගුවට ගැනුණේ අවසර ලැබුණු පසුය. 19න් පසු එසේ සිදු වී නැත.
- 18 යටතේ වංචා දූෂණ ගැන එකල ආණ්ඩුවේ අයට චෝදනා ගොනු කිරීම යටපත් වී තිබිණ. 19 යටතේ එසේ සිදු වීමට ඉඩක් තවම නැති බව පෙනේ.
- 18 සංශෝධනය අනුව ටෙන්ඩර්, කොන්ත්‍රාත් දීම හිතුවක්කාර ලෙස සිදුවිය. 19 සංශෝධනයෙන් පසු එම සමස්ත ටෙන්ඩර් ක්‍රියා පටිපාටිය ස්වාධීන කොමිසම මගින් සිදු වේ. ඒ මගින් දැවැන්ත හොරකම් වංචා වැළැකීමෙන් මහජන මුදල් මහජනයාගේ යටතට ඉතිරි විය හැකි ය.
- ජාතික ප්‍රසම්පාදන සහ ජාතික ගිණුම් සේවා යන අලුත් ස්වාධීන කොමිසම් දෙක නිසා මහජන මුදල් නාස්තිය දූෂණය වළකිනු ඇත. කලින් විගණකාධිපති යනු ජනාධිපතිගේ පත්වීමකි. එහෙයින් දූෂණ ඇති තැන්වල ගිණුම් පරීක්ෂා කිරීම නිසි ලෙස නොවිය. දැන් ඊට ජනාධිපතිගේ හෝ මැති ඇමතිවරුන්ගේ මැදිහත්වීමක් නැති නිසා නිදහසේ කළ හැකිය.

- පාර්ලිමේන්තුවේ පළමු සභා වාරයෙන් අවුරුද්දකට පසු එය විසුරුවා හැරීමට තිබූ බලය 19න් සීමා විය. දැන් එසේ කළ හැක්කේ අවුරුදු හතරහමාරකට පසුය. එහෙත් පාර්ලිමේන්තුවේ බහුතරයක මන්ත්‍රීවරුන්ගේ යෝජනා සම්මතයකින් එසේ කළ හැකිය.

- අමාත්‍ය ධුර සංඛ්‍යාව 30 කටත්, නියෝජ්‍ය හා කැබිනට් නොවන ඇමතිවරුන් 40 කටත් සීමා කළ යුතු බව 19 වැනි සංශෝධනයේ සඳහන් වේ. යම් වෙනස්කම් ඇතත් සීමාවක්ද පවතී.

- කලින් සමහර පනත් කඩි මුඩියේ දවස් දෙක තුනකින් 'සම්මත' කර ගැනිණ. දැන් එය පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට දින 14 කට පෙර ප්‍රසිද්ධ කිරීම ක්‍රියාත්මක වී ඇත.

- තරගයකින් ජනාධිපති ධුරයට පත් වූ විට සති දෙකකින් ධුරය බාරගත යුතුය. නැකැත් බල බලා සිටීමට ඉඩක් නැත. එවිට ඉතිරි ධුර කාලය අහෝසි වේ. ජනාධිපතිවරණය මැතිවරණ කොමිසමේ උපදෙස් හා නියමයන් අනුව කළ යුතුය.

- ජනාධිපතිගේ කටයුතු පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කළ හැකිය. කලින් එසේ ඉඩකඩක් නොතිබිණ.

- ජනාධිපතිට එරෙහිව නඩු පැවරිය නොහැකි බවට කලින් තිබුණු තත්වය වෙනස් වී මූලික අයිතිවාසිකම් නඩු පැවරිය හැකි බවට පත්විය.

- දැන් පත් කළ හැක්කේ ඇමති, නියෝජ්‍ය ඇමති, කැබිනට් නොවන ඇමති වශයෙන් පමණි. අධීක්ෂණ ඇමති, ව්‍යාපෘති ඇමති ආදී පත් කිරීම් අහෝසි වේ.

- අල්ලස් හා දූෂණ විමර්ශන කොමිසමට පැමිණිලි නැතිව වුවත් තම කැමැත්තෙන් පරීක්ෂණ ආරම්භ කළ හැකිය.
- තොරතුරු ලබා ගැනීම මූලික අයිතිවාසිකමක් ලෙස ව්‍යවස්ථාවෙන් පිළිගෙන තිබේ.
- කලින් සමෘද්ධි, දිවි නැගුම ආයතනවල ගිණුම් විගණකාධිපති යටතට නොගැනෙන බව සඳහන් විය. දැන් විගණන කොමිසමට යටත් නොවන කිසිම රාජ්‍ය ආයතනයක් නැත.

19 වැනි සංශෝධනයෙන් කියැවුණේ ජනාධිපතිගේ විධායක බලය අහෝසි කරන බවය. එය කොතරම් දුරට සිදු වී ඇද්දැයි ඉහත කරුණු සමග සසඳා බලන්න.

වත්මන් ජනාධිපති විධායක බලය යෙදූ අවස්ථා කීපයක් වෙයි. එනම්, රනිල් වික්‍රමසිංහ මහතාට අගමැති ධුරය පැවරීම, හිටපු අග විනිසුරු ඉවත් කොට වත්මන් අග විනිසුරු පත් කිරීම, ඉතාම අයුක්ති සහගත ලෙස සේවයෙන් ඉවත් කැරුණු හිටපු හමුදාපති සරත් ෆොන්සේකා මහතාත්, හිටපු අග විනිසුරු ශිරානි බණ්ඩාරනායක මහත්මියත් යළි සේවා තත්වයට පත් කිරීමය.

තවමත් ඉතිරි වී තිබෙන අඩු පාඩු පුරවැසියාගේ මැදිහත්වීමෙන් තුරන් කළ යුතු ය.

# ශ්‍රී ලංකාවේ ස්වාධීන කොමිෂන් සභා තොරතුරු

| ස්වාධීන කොමිෂන් සභා | කොමිෂන් සභාවේ සාමාජිකයන් | ලිපිනය | සම්බන්ධකර ගැනීමේ තොරතුරු |
|---|---|---|---|
| **ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව** | ආචාර්ය දීපිකා උඩගම (සභාපති)<br>හමීඩ් ගසාලි හුසේන් මහතා<br>සාලිය කේ.එම්. පීරිස් මහතා<br>අම්බිකා සත්කුනනාදන් මහත්මිය | නො. 165, කිංසි පාර, බොරැල්ල, කොළඹ 08 | 2685980<br>2685981<br>2696470<br>2689558<br>2677201<br>sechrc@sltnet.lk |
| **ජාතික පොලිස් කොමිෂන් සභාව** | මහාචාර්ය සිරි හෙට්ටිගේ (සභාපති)<br>පී.එච්. මනතුංග මහතා<br>සාවිත්‍රි විජේසේකර මහත්මිය<br>වයි.එල්.එම්. සවාහිර් මහතා<br>ඇන්ටන් ජෙයනාදන් මහතා | නො. 9, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණශාලා පරිශ්‍රය, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 | 0115107727<br>011 2683307<br>0115107721<br>0115107722<br>011 2683308<br>011 2683307<br>complaints@npc.gov.lk |
| **රාජ්‍ය සේවා කොමිෂන් සභාව** | ධර්මසේන දිසානායක මහතා (සභාපති)<br>සලාම් අබ්දුල් වේඩ් මහතා<br>ඩී. ශිරන්තා විජයතිලක මෙනවිය<br>ආචාර්ය ප්‍රතාප් රාමානුජම්<br>වී. ජෙගරාසසිංහම් මහත්මිය<br>සැන්ටි නිහාල් සෙනෙවිරත්න මහතා<br>එස්. රනුගේ මහතා<br>ඩී.එල්. මෙන්ඩිස් මහතා<br>සරත් ජයතිලක මහතා | නො. 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05 | 011-2136600<br>011-2136650<br>011-2136700<br>011-2136602<br>011-2136604<br>011-2136603<br>info@psc.gov.lk<br>sec-psc @ sltnet.lk |
| **අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කිරීමේ කොමිෂන් සභාව** | විනිසුරු වයිටස් බෝධිපාල වීරසූරිය (සභාපති)<br>විනිසුරු ඩබ්. ලාල් රන්ජිත් සිල්වා<br>චන්ද්‍රනාත් නෙවිල් ගුරුගේ මහතා<br>ඩිල් රුක්ෂි ඩයස් වික්‍රමසිංහ මහත්මිය (අධ්‍යක්ෂ ජෙනරාල්) | නො. 36, මලලසේකර මාවත, කොළඹ 07 | 011-2559923<br>011-2596360<br>011-2586257<br>0112595039<br>0112595040<br>0112586851<br>ciaboc@eureka.lk<br>sccy@sltnet.lk |
| **මුදල් කොමිෂන් සභාව** | උදිත හරිලාල් පලිහක්කාර (සභාපති)<br>වේලුපිල්ලේ කනගසභාපති මහතා<br>එම්.එම්. සෆ්හුල්ලා මහතා<br>අර්ජුන මහේන්ද්‍ර මහතා<br>ආචාර්ය ආර්.එච්.එස්. සමරතුංග මහතා | නො. 48, වජිර පාර, කොළඹ 04 | 011-2556834<br>0112 556840<br>0112556831<br>fincom@sltnet.lk |

| ස්වාධීන කොමිෂන් සභා | කොමිෂන් සභාවේ සාමාජිකයන් | ලිපිනය | සම්බන්ධකර ගැනීමේ තොරතුරු |
|---|---|---|---|
| **මැතිවරණ කොමිෂන් සභාව** | මහින්ද දේශප්‍රිය මහතා (සභාපති)<br>එන්. ජී. අබේසේකර මහතා<br>මහාචාර්ය රත්නජීව හූල් | තැ.පෙ. 02, සරණ මාවත, රාජගිරිය | 0112868441<br>0112868442<br>0112868443<br>0112868444<br>0112868426<br>comelesl@sltnet.lk |
| **ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව** | ඒ.එම්. ෆොන්සේකා මහතා (සභාපති)<br>ඩී.එන්.අයි.එෆ්.ඒ. වික්‍රමසූරිය මහතා<br>බී.ඊ.ආර්.සී. වෙඩික්කාර් මහතා<br>පී.ඒ.ඩී.සී.ආර්. පෙරේරා මහතා<br>නියාන් වහුදේවන් මහතා | ජාතික ප්‍රසම්පාදන නියෝජිත ආයතනය, මහ ලේකම් ගොඩනැගිල්ල, කොළඹ 01 | 0112484600<br>0112484700 |
| **සීමා නිර්ණය කොමිෂන් සභාව** | පවලිංගම් කනගරත්නම් මහතා (සභාපති)<br>ආචාර්ය අනිල ඩයස් බණ්ඩාරනායක<br>මහාචාර්ය සාහුල් හමීඩ් හිස්බුල්ලා | ව්‍යවස්ථාදායක සභාව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව (ස්ථිර ස්ථානයක් මෙවන විටත් ස්ථාපිත කර නැත) | 0112777227<br>0112777100 |
| **ගිණුම් සේවා කොමිසම** | එම්. ගාමිණී විජේසිංහ මහතා (සභාපති)<br>නිහාල් සුනිල් රාජපක්ෂ මහතා<br>ඉලංගකෝන් ගාමිණී අබේරත්න මහතා<br>වේලුපිල්ලෙයි කන්දසාමි මහතා<br>සෝමපාල පෙරේරා මහතා | විගණන දෙපාර්තමේන්තුව 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල | 0112887028<br>0112887034<br>Oaggov@sltnet.lk |

## විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

ලිපිනය : 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 05.

දුරකථන : 011 2370803 / 4

ෆැක්ස් : 011 2370801 / 2

වෙබ් අඩවිය : www.cpalanka.org

ඊමේල් : info@cpalanka.org